සැ. යු. —2011.07.15 දින පළ වූ අංක 1715 දරන *ගැසට් පත්‍රයේ* I-III, II සහ IV (අ) කොටස් පළ නොවීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,716 - 2011 ජූලි මස 22 වැනි සිකුරාදා - 2011.07.22

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

I කොටස : (III) වැනි ඡේදය - වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.

	පිටුව		පිටුව
වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්	—	කාර්මික සැළසුම් පිළිබඳ නිවේදන	—
වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන	346	විවිධ දැන්වීම්	—
පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන	—		

සැ. යු.— රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත 2011 ජූලි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සැ. යු. —කාර්මික ආරවුල් (සංශෝධන) පනත් කෙටුම්පත 2011 ජූලි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සතිපතා නිකුත් වන *ගැසට් පත්‍රයෙහි* පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නො ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

ලක්ෂමන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08.
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදාළ සියලු ම ලියුම් කියුම් කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 400, "සමාගම් මැදුරේ" 3 වැනි මහලේ පේටන්ට් බලපත්‍ර සහ සහ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතු ය.

පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනක ම පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර සතියේ වැඩ කරන දිනවල පස්වරු 2.00 දක්වා පමණක් භාරගනු ලැබේ.

වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයකට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති ලකුණක් , 1979 අංක 32 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ 112 වැනි වගන්තිය යටතේ, තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

විරෝධතා දැක්වීම

පහත සඳහන් වෙළෙඳ සේවා හෝ සාමූහික ලකුණු ලියාපදිංචි කිරීම ගැන විරෝධතාවය දැක්වීමට හේතු ඇති යම් කෙනෙකු මෙම *ගැසට් නිවේදනයේ* දින සිට තුන් මාසයක් ඇතුළත ඇම් 2 දරන ආකෘති පත්‍රය (අනු පිටපතකින් ද යුක්තව) මගින් විරෝධතා දැක්වීම ඉදිරිපත් කළ යුතු ය. එබඳු විරෝධතා දැක්වීමක් සඳහා ගාස්තුව රු. 750ක් වන අතර එම ගාස්තුව මුදලින්, චෙක්පතකින්, මුදල් ඇණවුමකින්, තැපැල් ඇණවුමකින් හෝ බැංකු අණකරයකින් ගෙවිය යුතු ය.

වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන

ශුද්ධියකි

2008 ජූලි මස 18 වැනි දින අංක 1559 දරන *ගැසට් පත්‍රයෙහි* පළ වූ 19 වැනි පන්තියට අයත් අංක 112342 දරන වෙළඳ ලකුණ පිළිබඳව නිවේදනයේ විෂයාංක 8 පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු ය: -

විෂයාංක 08: - ලකුණේ සටහන



ආචාර්ය ඩී. එම්. කරුණාරත්න.
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය,
"සමාගම් මැදුර",
3 වන මහළ,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

07–574 – 2011.07.22 වැනි දින අංක 1,716 දරන *ගැසට් පත්‍රය.*

ශුද්ධියකි

2010 ජනවාරි මස 08 වැනි දින 1636 දරන *ගැසට් පත්‍රයෙහි* පළ වූ 5 වැනි පන්තියට අයත් අංක 95458 දරන වෙළඳ ලකුණ පිළිබඳව නිවේදනයේ විෂයාංක 2 පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු ය: -

විෂයාංක 02: - ලැබුනු දිනය - 1999.11.19

ආචාර්ය ඩී. එම්. කරුණාරත්න.
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය,
"සමාගම් මැදුර",
3 වන මහළ,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

07–575 – 2011.07.22 වැනි දින අංක 1,716 දරන *ගැසට් පත්‍රය.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.